[illegible] සඳහා අප කැපවෙමු.

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம், 32, ஸ்ரீமத் மார்க்கஸ் பெர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 2698409; ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667; ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

සාමාන්‍ය දුරකථන / பொதுவான தொலைபேசி / General Telephone } 2682868, 2682869, 2682870

මගේ අංකය / எனது இல / My No. } CSWP/ADM/02-74/FI/01    ඔබේ අංකය / உமது இல / Your No. }    දිනය / திகதி / Date } 2018.06. 06

**<u>පාලන චක්‍රලේඛ 03/2018</u>**

ආණ්ඩුකාර ලේකම් (බ.ප),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප),
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ පිරිස් පුහුණු/ මුල්‍ය/ සැලසුම්/ ඉංජිනේරු),
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ප්‍රධාන අභ්‍යන්තර විගණක (අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව - බ.ප.)
ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානින්,

**<u>බස්නාහිර පළාත් සභාවට අයත් අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන සතු වෙබ්අඩවි අතුරෙන් හොඳම වෙබ් අඩවිය තේරීමේ තරඟය - 2018</u>**

බස්නාහිර පළාත් සභාවට පැවරී ඇති විෂයයන්ට අදාල කාර්යයන් ඉටුකිරීම සඳහා වූ තොරතුරු හා දත්ත විධිමත්ව කාර්යක්ෂමව හා ඵලදායි ලෙස යොදා ගනිමින් තොරතුරු තාක්ෂණ සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාවට ලබා දීම දිරිගැන්වීමේ අරමුණින් බස්නාහිර පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවල වෙබ් අඩවි පරීක්ෂා කර බලා යාවත්කාලීන කිරීම් නිසි පරිදි සිදුකර පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන තෝරා සම්මාන ප්‍රදානය කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවල වෙබ් අඩවි සියල්ලෙහි අන්තර්ගත තොරතුරු හා යාවත්කාලීනබව සහ නිරවද්‍යතාවය අනුව තෝරා ගැනීම සිදුකරන අතර ඒ සඳහා අවශ්‍ය සුදුසුකම්,පාදක කරගන්නා නිර්ණායක හා යෝජිත ලකුණු ලබා දීමේ ක්‍රමවේදය පහත දක්වා ඇත.

2.1. බස්නාහිර පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන වල **www.wpc.gov.lk** සහ **www.wp.gov.lk** යන වසම් නාමයන්ගෙන් (domain name) පවත්වා ගෙන යන වෙබ් අඩවි මෙම තරඟයට ඇතුල්වීමට සුදුසුකම් ලබයි.

| අනු අංකය | පාදක කරගන්නා නිර්ණායකය | | ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | **සම්පූර්ණබව/ත්‍රෛභාෂා පහසුකම** | | 10 |
| | 1.1 | සියලු වෙබ් පිටුවල අන්තර්ගතය සම්පූර්ණබව | 02 |
| | 1.2 | වෙබ් අඩවිය යාවත්කාලීන කර ඇතිබව | 02 |
| | 1.3 | බිහිදොර පිටුවේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන කුමන හෝ භාෂා මාධ්‍යයක් තෝරා ගැනීමේ පහසුකම පැවතිම | 02 |
| | 1.4 | සියලු වෙබ් පිටු ත්‍රෛභාෂා පහසුකම සහිතව පැවතිම | 02 |

| | | | |
|---|---|---|---|
| | 1.5 | බාගත කිරීමේ පහසුකම (අයදුම්පත්, චක්‍රලේඛආදිය) භාෂා 03 සඳහාම පැවතීම | 02 |
| **2** | **සංචලනය කිරීමට ඇති පහසුව (Navigation Facility)10** | | |
| | 2.1 | සියලුම සබැඳි (Links) ක්‍රියාකාරීතත්වයේ පැවතීම හා අදාළ තොරතුරු සඳහා පහසුවෙන් පිවිසිය හැකිවීම | 05 |
| | 2.2 | ප්‍රධාන මෙනුව සහ උපමෙනු නිසිපරිදි පෙළ ගස්වා ඇතිබව | 05 |
| **3** | **සම්මතයන්ට (Standard) අනුකූලව පැවතීම** | | **10** |
| | 3.1 | බහුලව පවතින වෙබ් බ්‍රවුසරයන් මත ක්‍රියාකිරීම (Browser Compatibility) | 03 |
| | 3.2 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) නිර්දේශිත රජයේ වෙබ්අඩවි සංවර්ධන ප්‍රමිතීන් (Government Web Development Standards) වලට අනුකූලබව | 05 |
| | 3.3 | පහසුවෙන් පිවිසිය හැකිබව (Availability) | 02 |
| **4** | **කාර්යසාධනය (Performance)** | | **10** |
| | 4.1 | වෙබ්අඩවිය / පිටු සාපේක්ෂව අඩුකාලයකින් වෙබ් බ්‍රවුසරය මත දිස්වීම | 05 |
| | 4.2 | වෙබ් අඩවියේ පිවිසුම් වාරගණන (Visitor Count) | 05 |
| **5** | **වෙබ අඩවි නිර්මාණය** | | **10** |
| | 5.1 | වෙබ් අඩවිය ක්‍රමවත්ව හා පැහැදිලි ලෙස සැලසුම්කර, නිර්මාණයකර ඇතිබව (Clear Site Architecture) | 03 |
| | 5.2 | අඩවි සංචලන සැකැස්ම (Site Navigation Structure) සෑම වෙබ් පිටුවක් සඳහාම පරිශීලකයාට පහසුවෙන් භාවිතා කළහැකි වන පරිදි යොදා ගෙන ඇති බව | 02 |
| | 5.3 | පරිශීලක සුහදශීලීබව (User Friendliness) | 05 |
| **6** | **පිටු සැකැස්ම** | | **10** |
| | 6.1 | ග්‍රැෆික්නිර්මාණ, වෙබ්අඩවි නිර්මාණය කිරීම සඳහා යොදා ගැනීම (Use of Chart, Graphics) | 02 |
| | 6.2 | සම්මත ප්‍රමාණයේ හා පහසුවෙන් කියවිය හැකි පරිදි Unicode Fonts වෙබ් අඩවිය සඳහා භාවිතාකර තිබීම හා තොරතුරු සුදුසු පරිදි වෙබ් පිටුවට සරිලනසේ පැහැදිලි ලෙස පෙළ ගන්වා ඇතිබව | 04 |
| | 6.3 | සියලුම වෙබ්පිටු නිසි පරිදි නම් කර ඇතිබව | 02 |
| | 6.4 | HTML මුහුණුවර වෙබ්අඩවිය සඳහා යොදා ගැනීම | 02 |
| **7** | **සංඛ්‍යාත්මකබව (Quantity)** | | **10** |
| | 7.1 | තොරතුරු අවබෝධ කිරීමට වැයවන කාලය අවම කර, එම තොරතුරු ඉක්මණින් ග්‍රහණය කිරීමට හැකිවන පරිදි දෘශ්‍ය තාක්ෂණික ශිල්පීය ක්‍රමෝපායන් (Visualisation Techniques) භාවිතය | 10 |
| **8** | **ගුණාත්මකබව (Quality)** | | **10** |
| | 8.1 | අන්තර්ගත තොරතුරුවල නිරවද්‍යතාවය හා සම්පූර්ණබව (Accuracy & Completeness of Content) | 02 |
| | 8.2 | නිර්මාණශීලීබව (Creativity) | 02 |
| | 8.3 | තොරතුරු ඉදිරිපත්කිරීමේදී පහසුවෙන් හඳුනාගත හැකි වන ලෙස සුදුසු පසුබිම් වර්ණයන්, borders හා නිදහස් අවකාශයන් භාවිතාකර පරිශීලකයන් වෙත ආකර්ශනීයලෙස තොරතුරු ඉදිරිපත් කර ඇතිබව (Appealing to the intended audience) | 04 |
| | 8.4 | දීර්ඝ ලෙස තොරතුරු ඉදිරිපත්කිරීමේදී (Bullets, Numbers, Links, Tabs, Sub Menus) භාවිතා කර එම තොරතුරු සංක්ෂිප්තව ඉදිරිපත් කර ඇති බව | 02 |
| **9** | **ආරක්ෂක ක්‍රමෝපායන් ක්‍රියාත්මකව පවතිනබව (Security)** | | **10** |
| | 9.1 | පරිශීලක මුරපද භාවිතය | 05 |
| | 9.2 | තොරතුරු ඉදිරිපත් කිරීමේදී දත්තවල සංවේදීබව පිළිබඳව | 05 |

| | | | |
|---|---|---|---|
| | | සැලකිලිමත්වී ඇතිබව | |
| 10 | තොරතුරු දැනගැනීමේ පනත | | 10 |
| | 10.1 | තොරතුරු පනත පිලිබඳ විස්තර කිරීම | 02 |
| | 10.2 | තොරතුරු පෝරම | 02 |
| | 10.3 | තොරතුරු නිලධාරින්ගේ විස්තර | 04 |
| | 10.4 | තොරතුරු පනතට අදාළ සූචි සහ ප්‍රගාමී තොරතුරු අඩංගුකිරීම | 02 |
| | | **මුළුලකුණු** | 100 |

**2.2යෝග්‍යතා නිර්ණායක**

i. තරඟාවලිය සඳහා යම් වෙබ් අඩවියක් නියමිත නිර්ණායකයන්ට අනුකූලව නිර්මාණය කර ඇත්ද යන්න සහ එක් එක් නිර්ණායකයන් සඳහා හිමිවන ලකුණු ප්‍රමාණය ඒ සඳහා නිශ්චය කරගත් ක්‍රමවේදයකට අනුව තීරණය කිරීමේ අයිතිය විනිශ්චය මණ්ඩලය සතුවේ.

ii. ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන විනිශ්චය මණ්ඩලයක් විසින් මෙම වෙබ් අඩවි විනිශ්චයට ලක්කරනු ලැබේ.

iii. තරඟාවලිය තුළ ජයග්‍රාහක වෙබ් අඩවිය තෝරා ගැනීමේදී විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය ලෙස සැලකේ.

iv. යම්කිසි වෙබ් අඩවියක් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලෙස කිසියම් පුද්ගලයකු හෝ ආයතනයක් විනිශ්චය මණ්ඩලය වෙත කුමන හෝ ආකාරයෙන් බලපෑම් සිදු කරන්නේ නම්එය තරඟයට ඉදිරිපත්වීම සඳහා නුසුදුසුකමක් වනු ඇත.එවිට විනිශ්චයකරුවන්ගේ තීරණය පරිදි අදාල වෙබ් අඩවිය තරඟයෙන් ඉවත්කිරීමට කටයුතු කරනු ලැබේ.

03. අයදුම්පත්‍රය **www.itrda.wp.gov.lk** වෙබ් අඩවිය හරහා බාගත කර, නිසිලෙස සම්පූර්ණ කර, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය සහිතව බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය වෙත තැපැල් මඟින් ලැබීමට සැලැස්වීමෙන් සහ වෙබ් අඩවිය හරහා ලියාපදිංචි වීම (Online Registration) මඟින් සිදු කර ගත යුතුය.(ඇමුණුම 01 මගින් අයදුම්පත්‍රයේ ආකෘතියක් දක්වා ඇත.)

04. හොඳම වෙබ් අඩවිය සතු අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන යන සම්මාන කාණ්ඩ03ක් වශයෙන් ප්‍රථම,දෙවන හා තෙවන ස්ථාන තෝරා සම්මාන ලබාදීම සිදුකරන අතර එම වෙබ් අඩවි සාර්ථක කර ගැනීම සඳහා දායක වූ නිලධාරින්ද ඇගයීමට ලක් කිරීමට තීරණය කර ඇත.

05. බස්නාහිර පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන සඳහා වෙබ් අඩවි නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාම දිරිගැන්වීම සඳහා පවත්වනු ලබනමෙම තරඟයට සහභාගි වන ආයතන ලියාපදිංචි කිරීම 2018.08.01 දින ආරම්භ කරන අතර 2018.08.31 දිනෙන් අවසන් කිරීමට නියමිතය.

වසර 2025 රජයේ ආර්ථික දැක්ම යථාර්තයක් බවට පත්කිරීමට සවියක් වෙමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවය ද තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ ප්‍රතිලාභ මහජනතාව වෙත ලබාදීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන මෙම තරඟාවලිය සඳහා ඔබගේ සක්‍රිය දායකත්වය ලබා දෙන ලෙස වැඩිදුරටත් දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.


| Deputy Chief Secretary | Administration | Personnel & Training | Finance | Planning | Engineering | Director Internal Audit |
|---|---|---|---|---|---|---|
| | Tel: 2693964<br>Fax:2669479<br>dcsadmin@cs.wpc.gov.lk | Tel: 2690058<br>Fax:2693952<br>dcspt@cs.wpc.gov.lk | Tel: 2693978<br>Fax:2679958<br>csfinance@wpc.gov.lk | Tel: 2693970<br>Fax:2676280<br>dcsplan@wpc.gov.lk | Tel: 2693968<br>Fax:2689900<br>dcsengs@wpc.gov.lk | Tel: 2689011<br>Fax:2689011 |

## බස්නාහිර පළාතේ පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අධිකාරී සතු වෙබ් අඩවිවලින් හොඳම වෙබ් අඩවිය තේරීම සඳහා අයදුම්පත්‍රය - 2018

වෙබ් ලිපිනය: [ ] .wp.gov.lk

### ආයතනය පිළිබඳ තොරතුරු :

ආයතනයේ නම : ............................................................................................

ආයතනයේ ලිපිනය : ............................................................................................

ආයතනයේ දුරකථන අංකය : ............................................................................................

ආයතනයේ ෆැක්ස් අංකය : ............................................................................................

ආයතනයේ වෙබ් ලිපිනය : ............................................................................................

ආයතන ප්‍රධානියාගේ නම : ............................................................................................

තනතුර : ............................................................................................

ඇමතුම් අංකය : ............................................................................................

ෆැක්ස් අංකය : ............................................................................................

ඊ මේල් ලිපිනය : ............................................................................................

### වෙබ් අඩවිය භාරව සිටින නිලධාරියාගේ විස්තර :

නම : ............................................................................................

තනතුර : ............................................................................................

ඇමතුම් අංකය : ............................................................................................

ෆැක්ස් අංකය : ............................................................................................

ඊ මේල් ලිපිනය : ............................................................................................

☐ තරඟයේ නියමයන් හා කොන්දේසි කියවා තේරුම් ගත් බවට මම එකඟවෙමි.

දිනය

ආයතන ප්‍රධානියාගේ අත්සන

# APPLICATION FOR BEST WEB SITE SELECTION COMPETITION IN WESTERN PROVINCIAL COUNCIL - 2018

Web Site URL: [ ] .wp.gov.lk

## Organization Information :

Organization Name : ............................................................................................

Organization Address : ............................................................................................

Organization Telephone No : ............................................................................................

Organization Fax No : ............................................................................................

Organization Email Address : ............................................................................................

Name of the Head of the Organization : ............................................................................................

Designation : ............................................................................................

Contact Number : ............................................................................................

Fax No : ............................................................................................

Email Address : ............................................................................................

## Web Site Administrative Person Contact Details :

Name : ............................................................................................

Designation : ............................................................................................

Contact Number : ............................................................................................

Fax No : ............................................................................................

Email Address : ............................................................................................

☐ I hereby acknowledge that I have read and understood the terms and conditions of the competition.

Date

Signature
Head of the Organization